4 ඒකකය - ජලයේ කාර්ය(2)

✓ **පෙළ පොත හෝ වෙනත් සුදුසු ඉගෙනුම් සම්පත් පරිශීලනයෙන් පහත ක්‍රියාකාරකම් සම්පූර්ණ කරන්න. අවශ්‍ය තැන්හි දී වැඩිහිටියෙකුගේ සහය ලබා ගන්න.**

පැවරුම 4.2

- ජල සැපයුම නොමැති දිනයක මුළුතැන්ගෙයි මුහුණදීමට සිදුවන අපහසුතා ලැයිස්තුවක් පිළියෙල කරන්න.
- ජලගත වගාවකට (පස් රහිත) අවශ්‍ය පෝෂක සපයා ඇති ආකාරය පිළිබඳ සොයා බලා වාර්තා කරන්න.

පැවරුම 4.3

ද්‍රාවකයක් ලෙස ජලය භාවිත වන වෙනත් අවස්ථා ලැයිස්තුවක් පිළියෙල කරන්න.

පැවරුම 4.4

- විවිධ වර්ණයෙන් යුතු සායම් (ඩයි වර්ග) ඉතා ස්වල්ප ප්‍රමාණයක් බැගින් ජලයේ දිය කර වර්ණවත් ද්‍රාවණ කිහිපයක් සකසන්න.
- ඒවා විවිධ හැඩති වීදුරු බඳුන්වලට දමන්න.
- එවැනි වර්ණවත් ද්‍රාවණ එදිනෙදා ජීවිතයේ දී යොදා ගන්නා අවස්ථා ලැයිස්තුවක් පිළියෙල කරන්න.

4.3 රූපය

පැවරුම 4.5

- විවිධ පැණි බීම වර්ගවල ලේබල් එකතු කරන්න.
- ඒවා සැකසීමේ දී ජලයේ දියකර ඇති විවිධ ද්‍රව්‍ය මොනවාදැයි සොයා බලන්න.
- එම ද්‍රව්‍යවල ලේඛනයක් සකසන්න.

ක්‍රියාකාරකම 4.2

අවශ්‍ය ද්‍රව්‍ය :- ලුණු ද්‍රාවණයක්, වයින් ස්ප්‍රිතු ලාම්පුවක්, ඉටිපන්දමක්, ටින් පියනක්

- ලුණු ද්‍රාවණ ස්වල්පයක් ටින් පියන මත තබා රත් කරන්න.

රත් කිරීම සඳහා රූපයේ දැක්වෙන තෙපාව සහ ස්ප්‍රිතු ලාම්පුවක් හෝ පතුලේ කවුළුවක් සහිත, භාවිතයෙන් ඉවත් කළ කිරිපිටි පෙට්ටියක් හා දල්වන ලද ඉටිපන්දම හෝ භාවිත කරන්න.

- නිරීක්ෂණ සටහන් කරන්න.



4.4 රූපය